# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 46 දරන
# සංස්කෘතික කටයුතු පිළිබඳ
# අධ්‍යක්ෂ (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 නොවැම්බර් මස 28 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 දෙසැම්බර් මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 20 යි                    තැපැල් ගාස්තුව : ශත 60 යි.

# 1983 අංක 46 දරන සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1983 නොවැම්බර් මස 28 වන දින.]

එල්. ඩී.—ඕ. 59/82.

**"සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ" තනතුර අහෝසි කිරීමට සහ ඔහුගේ කර්තව්‍ය ලේකම්වරයා විසින් ඉටුකිරීමට ආනුෂංගික විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1983 අංක 46 දරන සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර එය (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1981 අප්‍රේල් මස 1 වන දින සියලු කාර්ය සඳහා ක්‍රියාත්මක වූ ලෙස සැලකිය යුතු ය. (ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වීමේ දිනය.)

2. නියමිත දිනයේ සිට, වෙනත් යම් ලිඛිත නීතියක හෝ එවැනි යම් ලිඛිත නීතියකින් හෝ නීතියක් යටතේ නිකුත් කරන ලද, සාදන ලද, නියමිත හෝ බලය දෙන ලද යම් දැන්වීමක, අවසර පත්‍රයක, සංනිවේදනයක, ආකෘතියක හෝ වෙනත් ලේඛනයක "සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ" යන යෙදුම යෙදෙන කවර හෝ ස්ථානයක ඒ වෙනුවට "සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා" යන යෙදුම ආදේශ කළ යුතු අතර ඒ අනුව, එවැනි යම් ලිඛිත නීතියක සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ගැන සඳහන් කිරීමට "අධ්‍යක්ෂ" යන කෙටි යෙදුම භාවිත කර ඇති කවර හෝ ස්ථානයක එම කෙටි යෙදුම ඒ ලේකම්වරයා හෝ ඔහුගේ නියෝජිතයා ගැන වූ සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම් ගත යුතු ය. (වෙනත් ලිඛිත නීති සංශෝධනය කිරීම.)

3. නියමිත දිනයට පෙරාතුව සංස්කෘතික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ විසින් හෝ ඔහුගේ වාසියට ඇති කරන ලද, නිකුත් කරන ලද හෝ ලියා අත්සන් කරන ලද සෑම ගිවිසුමක්, එකඟවීමක් හෝ වෙනත් සාධන පත්‍රයක් හෝ ලේඛනයක්, එම දිනයේදී හෝ ඉන්පසු, සංස්කෘතික කටයුතු විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් හෝ ඔහුගේ වාසියට ඇති කරන ලද්දා වූ, නිකුත් කරන ලද්දා වූ හෝ ලියා අත්සන් කරන ලද්දා වූ ද එසේ ඇති කර, නිකුත් කර හෝ ලියා අත්සන් කර තිබුණා වූ ද ගිවිසුමක්, එකඟවීමක්, සාධන පත්‍රයක් හෝ ලේඛනයක් ලෙස සලකනු ලැබිය යුතු ය. (ගිවිසුම් ආදිය ආරක්ෂා කිරීම.)

ජ 72546—10,600 (83/10)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.